## අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



# ශාන්ති කර්ම

## ශාන්ති කර්ම

පුද පූජා පැවැත්වීම මනුෂ්‍යාගේ ස්වාභාවික ප්‍රවණතාවයකි. මානව පරිණාමය තුළ රෝග, දුර්භික්ෂ, ආපදා ඇති අවස්ථාවන්හී දී ඒවායින් සහනයක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් කරන යාග හෝම ශාන්ති කර්ම ලෙස හඳුන්වයි. ගැමියා ඉරහඳ ගස්-ගල් වැනි දේ පිළිබඳ ඇදහීම් කර ඇත. එම ඇදහීම් තුළින් යම්කිසි සෙතක් ශාන්තියක් ලැබෙන බව ඔවුන් විශ්වාස කරන ලදී.

ලංකාවේ පවතින ශාන්ති කර්ම ගායනා ප්‍රධාන සම්ප්‍රදායන් 03 ක් යටතේ දැක්විය හැක. එනම් **උඩරට. පහතරට, සබරගමු** වශයෙනි. ආතුරයාට ආශිර්වාද කිරීමේ දී යකුන් විශයෙහි ඉදිරිපත් කරන ගායනා ශෛලියට වඩා, දෙවියන් හා ග්‍රහයන් උදෙසා සිදුකරන ගායනා වලදී බෙර වාදන ශෛලිය. ගීත සාහිත්‍ය, හඬ පාලනය, උච්ඡාරණය මෙන්ම ඉදිරිපත් කරන ශෛලියේ ද වෙනස්කම් ඇත.

# උඩරට ශාන්ති කර්ම

- උඩරට ප්‍රදේශයට ආවේණික වූ ශාන්ති කර්ම ඇසුරින් මෙම ගීත නිර්මාණය වී ඇත
- ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය උඩරට බෙරයයි.
- කොහොඹා කංකාරිය උඩරට ශාන්ති කර්මය ලෙස ගැනේ.
- **ආසාතාත්මක හා අනාසාතාත්මක** වශයෙන් ගීත දෙයාකාරයෙන් ම වේ
- මෙම ශාන්ති කර්මය තුළ මල් යහන් කවි, පොල් මලේ කවි. කඩවර කවි ආදී කවි දක්නට ලැබේ.

**උඩරට ශාන්ති කර්ම**

දෙවියන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම
(දේව තොවිල්)

- කොහොඹා කංකාරිය

යකුන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම

- කඩවර සමයම
- දෙපොල් යාගය

ග්‍රහයින් උදෙසා සිදු කරන ශාන්ති කර්ම

- බලි යාග

# පහතරට ශාන්ති කර්ම

- පහතරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්ම ඇසුරින් මෙම ගී නිර්මාණය වී ඇත.
- පහත රට බෙරය ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.
- රට යකුම හෙවත් රිද්දි යාගය ප්‍රධාන ශාන්ති කර්මය වේ.
- ආඝාතාත්මක හා අනාඝාතාත්මක යන දෙයාකාරයෙන් ම කවි ගායනා කරයි.

**පහතරට ශාන්ති කර්ම**

**දෙවියන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම (දේව තොවිල්)**

- දෙවොල් මඩු, ගම් මඩු, පූනා මඩු, ගිනි මඩු

**යකුන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම**

- සන්නි යකුම, රට යකුම, හූනියම් කැපිල්ල, මහ සොහොන් සමයම, කුමාර සමයම, ගොපලු සමයම

**ග්‍රහයින් උදෙසා සිදු කරන ශාන්ති කර්ම**

- බලි යාග, ග්‍රහ පූජා. ග්‍රහ ශාන්ති කර්ම

අන්තර්ගතය - පී.එම්. ප්‍රැන්සිස්, උපගුරු, කුලි/ සුරදූත බාලිකා ම.වි. කුලියාපිටිය.
සැකසුම - ජේ.ඩී.ඊ. නිල්මිණි මෙය - මො/තණමල්විල ජාතික පාසල, තණමල්විල

The National e-learning Portal for The General Education
nie.gov.

# සබරගමු ශාන්ති කර්ම

- සබරගමු ප්‍රදේශයට ආවේණික වූ ශාන්ති කර්ම ඇසුරින් මෙම ගී නිර්මාණය වී ඇත.
- දවුල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.
- පහන් මඩු ශාන්ති කර්මය සබරගමු ප්‍රධාන ශාන්ති කර්මය වේ.
- සබරගමු සම්ප්‍රදායේ ප්‍රකට ශාන්ති කර්ම අතර පහන් මඩු, පූනා මඩු, තුන් දා ගින මඩුව. මංගර මඩු, අත් බලි, මල් බලි, දිය කොරහෙ බලි ආදි ප්‍රකට බලි වර්ග වේ.
- අනාඝාතාත්මක හා අඝාතාත්මක යන දෙයාකාරයෙන් ම කවි ගායනා කරයි.

**පහතරට ශාන්ති කර්ම**

දෙවියන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම
(දේව තොවිල්)

- ➢ පහන් මඩු, හැල්ලුම් මඩු, කිරි මඩු

යකුන් උදෙසා සිදු කරන ශාන්ති කර්ම

- ➢ ඉර මුදුන් සමයම, 18 සන්නිය, මංගල සමයම, දේව තොවිලය

ග්‍රහයින් උදෙසා සිදු කරන ශාන්ති කර්ම

- ➢ බලි යාග, ග්‍රහ පූජා

අන්තර්ගතය - පී.එම්. ප්‍රැන්සිස්, උපගුරු, කුලි/ සුරදූත බාලිකා ම.වි. කුලියාපිටිය.

සැකසුම - ජේ.ඩී.ඊ. නිල්මිණි මෙය - මො/තණමල්විල ජාතික පාසල, තණමල්විල

# උඩරට ශාන්ති කර්ම ගීත

- සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා
  වමතට විදුරු මිණියක් රැගෙන නද කරා
  පෙර සිට උපත පන්දම යාග කවි කරා
  මෙ ඔබට ආවඩන් සැම දෝෂ දුරු කරා

- අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට දෝ වැඩ ඉන්නේ
  ඉන්ද්‍ර රැසින් ලොව නැංග එගින් රැස් දෝ විහිදෙන්නේ
  ඉන්ද්‍ර නීල කුළු වලා ගැබේ රන් ඉඹුලෙ වෙසෙන්නේ
  ඉන්ද්‍ර දිගින් හිරු රංග මඩල බැස සෙත සලසන්නේ

- නිරිත කොන යුතා මල් මල් සුවැඳැති වැටෙක වනවෙතා
  උරඟ පෙණ ලතා දුන්වන් පාටින් මැණික හිමිවෙතා
  තල ද කිරිබතා ලොල් ලොල් වඩවන සිතට රුචි වෙතා
  පණිදු දෙති සෙතා සුන් බුන් කර දොස ඔබට සෙත පතා



අන්තර්ගතය - පී.එම්. ප්‍රැන්සිස්, උපගුරු, කුලි/ සුරදූත බාලිකා ම.වි. කුලියාපිටිය.
සැකසුම - ජේ.ඩී.ර්. නිල්මිණි මෙය - මො/තණමල්විල ජාතික පාසල, තණමල්විල

# සබරගමු ශාන්ති කර්ම ගීත

- ගුණ දැනේ බෝසත් අනේ පෙර ඉපදුනේ ගරවකු          මෙනේ
  අද වුණේ දැසම අනේ මව්පිය සෙනේ සිටිනා          තැනේ
  කෙතකිනේ කරලුත් ගෙනේ මිටි බදිමිනේ දී          රකිමිනේ
  දුරලනේ දොස සතතිනේ මුණි ගුණ දැනේ බුද          දිනයෙනේ

- සුද්ධෝදන රජුට දාව උපන් එ          නරවර
  ලද්ද එ කිරි මව් දහසක් සතියෙන්          පෙමකර
  වැද්ද නොදී එන පිරිපත උවදුරු          දුරුහැර
  බුද්ධ රත්නෙ අනුහසයෙන් කඩතුරාව          හැර

- සොදින හඬ නගා දෙපයින් ගමන්          යන
  පොළොවෙන් අඩි හතක් ඇතින් දිවැස්          ලන
  පතල් වලම හැමවිට හොල්මන්          කරන
  පාතව භෛරවී දෝශය          මුදාලන

- සුවඳ පැනින් හිස නවා          ගන්නේ
  සුවඳ දුවඳ අත පාවා          ගන්නේ
  සුවඳ සඳුන් ඇඟ ගල්වා          ගන්නේ
  එසඳ දෙව රන් අතට          වඩන්නේ



# පහතරට ශාන්ති කර්ම ගීත

- උපත පෙරා කළිඟු පුරා - සිරි වසරා සුරත දරා
  බැස එවරා දිග ඉඳුරා - ඉඹුල තුරා සෙවණ කරා
  කොකු මගරා පත් නිතොරා - ඉඳ සපුරා තුරඟු වරා
  මෙ දිව යුරා සෙත් පතුරා - රකි නිදොල මෙ අතුරා

- එර්දි වෙලා උඩු ගුවනේ වඩින්නේ
  එර්දි සළුව ගෙන පවන් සලන්නේ
  දුනන්නු මෙ කිරිදන වරද නොගන්නේ
  රුහුණු රටින් කිරි බිසව් වඩින්නේ

**(කිරි අම්මා ශාන්ති කර්ම ගී)**



අන්තර්ගතය - පී.එම්. ප්‍රැන්සිස්, උපගුරු, කුලි/ සුරදූත බාලිකා ම.වි. කුලියාපිටිය.

සැකසුම - ජේ.ඩී.ඊ. නිල්මිණි මෙය - මො/තණමල්විල ජාතික පාසල, තණමල්විල

The National e-learning Portal for The General Education

noe.gov.